දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

පාසල් කටයුතු හා පෞද්ගලික පාසල්

ඔබේ අංකය / உமது இல. / Your No. : ..............................

මගේ අංකය / எமது இல. / My No. : ඒඩී/01/12/03/10/10

දිනය / திகதி / Date : 2005.04. 29

චක්‍රලේඛ අංක. **2005/16**

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළුම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත.

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ අනුමත විෂයමාලා ක්‍රියාත්මක කිරීම**
**කණිෂ්ඨ ද්විතීයක (6-9) සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික (10-11) ශ්‍රේණි**

උක්ත කරුණට අදාලව මගේ අංක අති.ලේ.(අධ්‍යා.සං.) හා 1999.11.30 දිනැති අංක 99/45 දරණ චක්‍රලේඛයේ 08 ඡේදයේ සඳහන් 10 හා 11 ශ්‍රේණි සඳහා වූ තාක්ෂණික විෂයයන් යටතට තොරතුරු තාක්ෂණ විෂයය ද ඇතුලත් කරනු ලබන අතර ප්‍රථමයෙන් එය 2006 වර්ෂයේදී 10 වන ශ්‍රේණියට හඳුන්වා දෙනු ලබන අතර ඉන් ඉදිරියට 10 හා 11 ශ්‍රේණි සඳහා තාක්ෂණික විෂයයක් ලෙසින් ක්‍රියාත්මක වේ. 2006 වර්ෂයේදී එම විෂයය තෝරාගත් සිසුනට 2007 වර්ෂයේදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඒ සඳහා පෙනී සිටීමට හැකියාව ලැබේ.

තොරතුරු තාක්ෂණික විෂයය 99/45 චක්‍රලේඛයේ සඳහන් අනිවාර්ය විෂයය කාණ්ඩයට ඇතුලත්වන බැවින් ඒ සඳහා දැනට තාක්ෂණික විෂයයන් සඳහා වෙන්කර ඇති ආකාරයට සතියකට කාලච්ඡේද 4 ක් ඒ සඳහා වෙන් කෙරේ.

මේ සමබන්ධ වැඩිදුර උපදෙස් මෙම අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ ශාඛාව මගින් පාසල් වෙත ලබා දෙනු ඇත.

එසේම 99/45 චක්‍රලේඛයේ 10 හා 11 ශ්‍රේණි සඳහා වූ අතිරේක විෂයයන් යටතට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය ද ඇතුලත් කරනු ලබන අතර ප්‍රථමයෙන් 2006 වර්ෂයේද 10 වන ශ්‍රේණියට හඳුන්වාදෙනු ලබන අතර ඉන් ඉදිරියට 10 හා 11 ශ්‍රේණි සඳහා අතිරේක විෂයයක් ලෙසින් ක්‍රියාත්මක වනු ඇත. 2007 වර්ෂයේදී 11 වන ශ්‍රේණිය තුලද ක්‍රියාත්මක වනු ඇත.

2006 වර්ෂයේදී සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය අතිරේක විෂයයක් ලෙසින් තෝරාගත් සිසුනට 2007 වර්ෂයේ දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඒ සඳහා පෙනී සිටීමට හැකිය.

මෙය අතිරේක විෂයයක් වන බැවින් සෙසු අතිරේක විෂයයන්ට වෙන්කර ඇති ආකාරයට සතියකට කාලච්ඡේද දෙකක් වෙන්කළ යුතුවේ.

වෛද්‍ය ටාරා ද මෙල්
ලේකම්
අධ්‍යාපන ලේකම්

පිටපත්.1 අධ්‍යක්ෂ ජනරාල් -ජාතික අධ්‍යාපන ආයතනය.. අවශ්‍ය ගුරු පුහුණු කටයුතු හා විෂය නිර්දේශ සැකසීම සඳහා
2. විභාග කොමසාරිස් ජනරාල් -2007 වර්ෂයේ සිට තාක්ෂණික විෂයයක් ලෙසින් විභාගයට අවශ්‍ය කටයුතු කිරීම සඳහා
3. සභාපති ජාතික අධ්‍යාපන කොමසම - දැ.ගැ.ස.
4. අධ්‍යාපන අධ්‍යක්ෂ- තොරතුරු තාක්ෂණ
5. සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැනගැනීම සඳහා

C:\Documents and Settings\Administrator.PMO\My Documents\circular.doc